**ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 14 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 77.27 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 65.11 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 12.16 ක් හෙවත් සියයට 15.74 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 66.78 | 59.16 | 7.62 | 11.41 |
| මූලධන | 10.49 | 5.95 | 4.53 | 43.28 |
| **එකතුව** | **77.27** | **65.11** | **12.16** | **15.74** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2.90 | 2.79 | 1.40 | 2.10 | 16.00 | 9.32 |

**2.3 විගණන නිරීක්ෂණය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යෑම සඳහා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1. විසර්ජන ගිණුම**

**3.1.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛයේ (2) ඡේදය අනුව, ඉන්ධන සහ ප්‍රවාහන යන වැය විෂයවලින් පිළිවෙලින් සියයට 15 ක් සියයට 10 ක අනිවාර්ය ඉතිරි කිරීමක් සිදු කළ යුතු වුවද, එසේ කර නොතිබුණි. එසේම එම වැය විෂයයන්ට අතිරේක ප්‍රතිපාදන ලෙස පිළිවෙලින් රු. 3,500 ක් හා රු. 832,700 ක් ලබා ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සකසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4 ක සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.1.2 බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය පිළිබඳ ගෙවීම් පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, රු. 1,215,854 ක් වූ බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94 (i) හා 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.4 වගන්තිය ප්‍රකාර, බැඳීම් ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වුවද, එවැනි තහවුරු කර ගැනීමකින් තොරව රු. 443,960 ක් වූ බැරකම් වලට බැඳී තිබුණි.

## 3.2 අත්තිකාරම් ගිණුම්

--------------------

ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම්

--------------------------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව යටතේ වූ ඇවර කිරීමේ ගිණුම් 02 ක කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.2.1 වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවේ විෂය අංක 0999-08 දරන පාලන වියදම් ඇතුළුව රබර්, තේ, පොල්, නිෂ්පාදන අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය හා පෝර්මික් සහ ඇසිටික් අම්ල මිලට ගැනීම හා විකිණීම පිළිබඳ අත්තිකාරම් ගිණුම

--------------------------------------------------------------------------------------------------------

1997 ජූලි 16 දිනැති අංක 64 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කඩිනමින්ද, මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාර වර්ෂ දෙකක් තුළදී ද, නිම කළ යුතු වුවද, වර්ෂ 20 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, යථෝක්ත අත්තිකාරම් ගිණුමේ ඇවර කටයුතු නිම කර නොතිබුණි.

### 3.2.2 අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දේශීය හා අනෙකුත් නිෂ්පාදන මිලදී ගැනීම, එක්රැස් කිරීම හා අලෙවිය, ශීත ගබඩා පහසුකම් සැපයීම හා ආරෝග්‍ය ශාලා පහසුකම් සැපයීම සඳහා වූ විෂය අංක 999/407 දරන අත්තිකාරම් ගිණුම

--------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1998 මැයි 20 දිනැති අංක 13 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හා මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාරව වසර දෙකක් තුළදී ගණන් බේරා වසා ඇවර කිරීමේ කටයුතු නිම කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය වන විට වසර 27 ක කාලයක් ගත වී තිබුණද ඇවර කිරීමේ කටයුතු මෙතෙක් නිම කර නොතිබුණි.

(ආ) රජයේ ඉඩම් ආඥා පනතේ (අධිකාරිය 454) 6 (1) වැනි වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍රය ප්‍රකාරව පැවරූ වත්කම නාගරික සංවර්ධන අධිකාරිය තම උපයෝගී කාර්යයන්ගෙන් බැහැරව යොදවා ඇත්නම් නැවත එම දේපල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පවරා ගත යුතු වුවද, එම දේපල සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කර නොතිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ අයවැය ඇස්තමේන්තුව හා ප්‍රසම්පාදන සැලැස්ම අතර රු. 600,000,000 ක වෙනස්කම් වූ බැවින් ප්‍රසම්පාදන සැලැස්ම, අයවැය ඇස්තමේන්තු හා එකඟ නොවන බව නිරීක්ෂණය විය.

**3.4** **වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ (T) සම්බන්ධව කටයුතු කළ යුතු බව දක්වා තිබුණද 2016 භාණ්ඩ සමීක්ෂණයේදී 'T'අක්ෂරය යෙදූ භාණ්ඩ සම්බන්ධව මෙතෙක් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

**3.5** **කාර්යසාධනය**

**-----------------**

2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තු ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2016 වර්ෂයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුව, වර්ෂය අවසානයේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වගකීම් ක්ෂේත්‍ර 05 කට අදාල අපේක්ෂිත ප්‍රතිඵලය ලබා කර ගැනීම/ ඒ සඳහා ක්‍රියා කිරීම ප්‍රමාණවත් බවට විගණනයේදි තහවුරු නොවුණි.

(ආ) 2013 අයවැය කථාවේ ප්‍රකාශ කළ පරිදි , මුදල් රෙගුලාසි සංග්‍රහය සංශෝධනය කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණි. ඒ අනුව එය 2013 සිට අඛණ්ඩව වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම්වල ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණු අතර අදාල ලිපිගොනුව අනුව, මුදල් රෙගුලාසි සංග්රහය 2015 ජනවාරි මස වන විට මුද්‍රණය කර අවසන්ව තිබුණි. එසේ වුවද එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් ලබා ගත යුතු බව දන්වා තිබුණද ඒ සඳහා කිසිඳු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබූ බැවින් අදාල කාර්යය මෙතෙක් නිම වී නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 104 සහ 113 යටතේ පාඩු හා කපාහැරීම් පිළිබඳව කටයුතු කිරිම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකිම්වල ඇතුලත් ප්‍රධාන අංගයක් වන අතර දෙපාර්තමේන්තු ලේඛනය අනුව, 2015 වර්ෂය තුල දි රු.මිලියන 133.74 ක් වූ පාඩු හා කපාහැරීම් සිදු කර තිබුණු අතර 2016 දී එය රු.මිලියන 807.40 ක් වීම හේතුවෙන් 2015 වර්ෂයට සාපේක්ෂව වැඩි විම රු.මිලියන 673.66 ක් එනම් සියයට 504 ක් විය. 2016 වර්ෂයේ රු.මිලියන 807.40 ක් වූ හානි, පාඩු හා කපාහැරීම් තුළ 2016 ජනවාරි 07 දින රු.මිලියන 2.87 ක යුධ හමුදාවේ රථයකට සිදුවූ අලාභය කපා හැරීම ඇතුලත් කර නොතිබුණි. කාර්යසාධන වාර්තාවේ මෙම මුළු කපා හැරීම් සාවද්‍ය ලෙස රු.මිලියන 153.33 ක් ලෙස අඩුවෙන් වාර්තා කර තිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම අනුව රාජ්‍ය අංශය සතු සියළුම වත්කම් සඳහා දත්ත පදනමක් (Database) සකස් කර පවත්වා ගෙන යාමට හා ජාතික වත්කම් ලේඛනයක් සකස් කිරීමට අපේක්ෂා කර තිබුණද, එවැනි දත්ත පද්ධතියක් හෝ ජාතික වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. එසේම ජාතික වත්කම් ලේඛනයක් පැවැත්වීමට අදාලව චක්‍රලේඛයක් හෝ නිකුත් කර නොතිබුණි. රාජ්‍ය වත්කම් කළමනාකරණය සඳහා වූ තොරතුරු එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුවේ එක් කාර්යයක් වුවද,ඉහත කී පරිදි මේ සම්බන්ධයෙන් වර්ෂය තුළ සැලසුම් කළ කාර්යයන් ඉටු නොවීම හේතුවෙන් මෙම කාර්යය සඳහාම වෙනම කාර්යාලයක් පිහිටුවීමට රේඛීය අමාත්‍යාංශයට සිදුව තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 153 ප්‍රකාරව, රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තා ලැබීමෙන් පසුව, එම වාර්තාවේ ඇතුළත් විවිධ කරුණු පිළිබඳව භාණ්ඩාගාර සටහන් මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් පිට භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කළ යුතු විය. මහා භාණ්ඩාගාරය වෙනුවෙන්

එම වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර ඉදිරි මූල්‍ය කටයුතුවලදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් මෙම සටහන් පත්‍ර අධ්‍යයනය කර ඒවා මඟ පෙන්වීම් ලෙස භාවිතා කරනු ලැබේ. 2005 සිට 2010 දක්වා වූ මුදල් වර්ෂ සඳහා වූ එම වාර්තා සඳහා අදාල සටහන් නිකුත් කළ බව විගණනයට දන්වා තිබුණද, එදිනෙන් පසු නිකුත් කළ රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාවලට අදාල සටහන් මෙතෙක් නිකුත් කර නොතිබුණි.

(ඊ) 2016 අයවැය යෝජනා අංක 425 හා 426 අනුව, වර්ෂය තුළදී සියළුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කිරීමටත් එමඟින් අරමුදල්වල පැවැත්ම සාධාරණීයකරණය කිරීමට, එම අරමුදල්වලට අදාල ව්‍යවස්ථාවන් වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට හා ඒ සමඟම අරමුදල්වල ලැබීම් සහ ගෙවීම් පාර්ලිමේන්තුවේ පාලනයට ගෙන ඒමටත් යෝජනා කර තිබුණි. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මෙම කාර්යයට අදාල ලබා ගෙන තිබූ අතිරේක ප්‍රතිපාදනය රු. මිලියන 10.80 ක් වූ අතර ඉන් රු. මිලියන 4.13 ක් ඒ සඳහා පත්කළ කමිටු සාමාජිකයන් වෙත ගෙවා තිබුණු නමුත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ii) අයවැය යෝජනාව අනුව, සියළුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය කළ යුතු වුවද, කමිටු වාර්තාව මඟින් අරමුදල්, මහජන හා මහජන නොවන ලෙස වර්ග කර තිබුණු අතර මහජන නොවන අරමුදල් 105 ක් සමාලෝචනය යටතේ සලකා බලා නොතිබුණි. එම මහජන නොවන අරමුදල් තුළ ව්‍යවස්ථාපිත අරමුදල්ද ඇතුළත්ව තිබුණි. තවද අරමුදල් කිහිපයක් දෙපාර්තමේන්තුවට වාර්තා වී නොමැති බවත් රු. මිලියන 16.97 ක් වටිනා අරමුදල් 10 ක් සඳහා විශේෂ අවසරයක් ලබාගෙන වෙන් වෙන් වශයෙන් සමාලෝචනය කිරීම සඳහා පසුව පියවර ගත යුතු බවටත් කමිටුව විසින් වාර්තා කර තිබුණි. ඒ අනුව අයවැය යෝජනා මඟින් අපේක්ෂිත අරමුණු සම්පූර්ණයෙන්ම ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය විය.

(iii) එසේම, අරමුදලින් අපේක්ෂිත කාර්යය / සේවාව සිදු නොවන බව හෝ එම අරමුදල පවත්වාගෙන යාම සාධාරණ නොවන බව කමිටුවේ මතය වේ නම්, එම අරමුදල්, 2017 මූල්‍ය වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත යටතට ගත යුතු වේ. ඒ බව ප්‍රධාන කමිටුව සඳහා සාමාජිකයින් පත් කිරීම් ලිපිවල සඳහන් කර තිබුණි. එසේ වුවද කමිටු වාර්තාව නිකුත් කිරීමට හා ආර්ථික සංවර්ධන අමාත්‍ය මණ්ඩල කමිටුවට නිර්දේශ ඉදිරිපත් කිරීම 2017 ජුනි මාසය අවසානය තෙක් ප්‍රමාද වී තිබුණි. ඒ අනුව එම අපේක්ෂිත කාර්යය මෙන්ම අරමුදල්වල පැවැත්ම සාධාරණීකරණය හා එම අරමුදල්වලට අදාල ව්‍යවස්ථාවන් වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම මෙතෙක් සිදුවී නොතිබුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

දෙපාර්තමේන්තුව විසින් පොදු 172 ලදු පොත් මුද්‍රණය කරවා බෙදා හැරමේ ක්‍රියාවලියට අදාලව පහත නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු රජයේ කාර්යාල සඳහා පොදු 172 ලදුපොත් නිකුත් කිරීම සිදු කරනු ලබයි. වරකට මෙම ලදුපොත් 10,000 බැගින් රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කර තිබුණි. දෙපාර්තමේන්තුවේ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම පොත්

දෙපාර්තමේන්තුව වෙත ගෙන එනු නොලබන අතර වරින් වර පොත් සුළු ප්‍රමාණයක් පමණක් රැගෙන එනු ලබයි. බොහෝ අවස්ථාවලදී ලදුපොත් රජයේ මුද්‍රණාලයේදීම අදාල ආයතන වෙත නිකුත් කරනු ලබන බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, අවස්ථා කිහිපයකදී මෙම ලදුපොත් කාණ්ඩ වශයෙන් මුද්‍රණයේදීම අස්ථානගත වී තිබුණු අතර මුද්‍රණයේදී නිකුත් කරනු ලබන පොත්, අනුක්‍රමික අංක පිළිවෙල අනුව නිකුත් නොකරන බව දෙපාර්තමේන්තු විසින් නඩත්තු කර තිබූ තොග ලේඛනය පරීක්ෂාවේදී අනාවරණය විය. ලදුපොත්, මුදල් හා සෘජුව සම්බන්ධවන්නක් වන බැවින්, ඊට අදාලව විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් වාර්තා පවත්වා ගෙන යා යුතු වුවද, පවත්වා තිබූ වාර්තාවල අඩුපාඩු සහ දුර්වලතා පැවතුණි. ඒ නිසා මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 17 | 11 |
| (ii) තෘතියික මට්ටම | 02 | 02 | 00 |
| (iii) ද්විතියික මට්ටම | 33 | 30 | 03 |
| (iv) ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 |
| **එකතුව** | **80** | **63** | **17** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 80 න් තනතුරු 17 ක පුරප්පාඩු පැවතීම නිසා එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 21 ක් වී තිබුණු අතර මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක් පැවතුණි. කෙසේ වුවද, ආයතන ව්‍යුහය ප්‍රතිසංවිධාන ගතකිරීම හා තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීම මගින් මෙම පුරප්පාඩු බාධාවක් නොවන අයුරින් කටයුතු කරන ලද බව විගණනයට දන්වා තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර ගැනීම කෙරෙහි අවධානය යොමුකල හැකි බව නිරීක්‍ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර මෙන්ම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක්ද වැඩ බැලීමේ පත්වීම් මගින් පුරවා තිබුණු අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 03 න් එක් තනතුරක් මේ වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) වැඩබලන පදනම මත පුරවා තිබුණු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2013 මැයි 02 දින සිට නිලධාරිනියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පත් කර තිබුණද, ඒ සඳහා ආවරණ අනුමැතිය හෝ විගණිත දිනය වූ 2017 ජූලි 27 දින වන විටත් ලබා ගෙන තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(ඈ) ද්විතීයික මට්ටමේ තනතුරක් වන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර තනතුර, අනුමත තනතුරක් නොවුණද, සත්‍ය කාර්ය මණ්ඩලය තුළ එම තනතුරේ නිලධාරීන් 03 දෙනෙකු වසර

ගණනාවක සිට සේවයේ යොදවා ඇති අතර ඊට අදාල අනුමැතීන් ලබා ගැනීමට 2017 අගෝස්තු 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) ඇතැම් තනතුරු පුරප්පාඩු වසර ගණනාවක සිට පවතින බව නිරීක්ෂණය වූ අතර එම තනතුරු පිරවීමට කටයුතු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවේ අරමුණු / කාර්යයන් ඉටු කිරීමේදී බාධා ඇතිවිය හැකි බව නිරීක්ෂණය වුවද, පුරප්පාඩු පැවතීම බාධාවක් නොවන අයුරින් කටයුතු කරන ලද බව දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි.